# ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක ස්ථාන හායනය කෙරෙහි බලපාන මානුෂීය ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යනයක් (සංචාරක කර්මාන්තය ඇසුරෙන්)

බී. එම්. ආර්. වී. බණ්ඩාර, ජේ . ජී . මධුෂාන්*

ඈත දිගු අතීතයකට හිමිකම් කියන ශ්‍රී ලංකාව පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත උරුමයන් රාශියක් පිහිටි රටකි. මෙම පුරාවිද්‍යාත්මක උරුමයන් ශ්‍රී ලංකාවේ ප්‍රෞඪ අතීතය පිළිබඳව ලොවට කියාපානු ලබයි. රටේ සමස්ත භූමි ප්‍රදේශය තුලම අඩු වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති පුරාවිද්‍යාත්මක උරුමයන් මෙරට දෙස් විදෙස් සංචාරකයින් ආකර්ෂණය කරගන්නා ප්‍රධාන මෙවලම වී ඇත. සංචාරක කර්මාන්තය තුලින් උපයනු ලබන ආදායම මෙරට විදේශ විනිමය ලැබෙන ප්‍රධාන ම මාර්ගයක් ද වී ඇත.

නමුත් මෙම පුරාවිද්‍යාත්මක ස්ථාන (ගොඩනැගිලි, නටබුන්, සිතුවම්, වාරි කර්මාන්ත) ආදියෙහි ඉදිරි පැවැත්ම කෙරෙහි වර්තමානය වන විට එල්ල වී ඇත්තේ බරපතල අභියෝගයකි. විශේෂයෙන් ම සංචාරක පැමිණීම තුළ සිදුවන මානුෂ ක්‍රියාකාරකම් පුරාවිද්‍යාත්මක උරුමයන් විනාශ වීමට දැඩි ලෙස බලපා ඇත. විශේෂයෙන් ම සංචාරකයන්ගේ නො හික්මුණු ක්‍රියාකාරකම්, නොදැනුවත්භාවය මෙන් ම පුරා විද්‍යා උරුම කළමනාකරණය පිළිබඳව පවත්නා නීතිරීතින්හි දුර්වලතා ආදිය මේ සඳහා බලපා ඇත. මෙම අධයනනය තුලින් වර්තමානය වනවිට පුරාවිද්‍යා උරුමයන්හි ඉදිරි පැවැත්මට සංචාරක කර්මාන්තයෙන් එල්ල වී ඇති අභියෝග පිළිබඳව විමර්ශනය කිරීමත් එම හායන කාරක අවම කරගැනීමට හා වැළක්වීමට ගත හැකි පියවර පිළිබඳව යෝජනා හා මත ඉදිරිපත් කිරීමත් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී තෝරාගත් ස්ථාන කිහිපයක් ගවේෂණය කිරීම තුලින් හා ඒ හා ආශ්‍රිතව පුරාවස්තූන් විනාශය කෙරෙහි සංචාරක කර්මාන්තය බලපා ඇති ආකාරය හා එම ක්‍රියාවලින් වළක්වාලීමට හා අවම කිරීමට සුදුසු යෝජනා යෝජනා ඉදිරිපත් කිරීමට මෙයින් බලාපොරොත්තු වේ .

මුඛ්‍ය පද :- පුරාවිද්‍යාව , පුරාවිද්‍යා උරුම , සංචාරක කර්මාන්තය , පුරාවස්තු හායනය , පුරාවිද්‍යා සංරක්ෂණය

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය Madushan75080@gmail.com